# කුඹුරුවල ධාන්‍ය වර්ග වගාවට ඇති ඉඩකඩ

කෘෂිකර්ම නිලධාරී

**එස්. සමරකෝන්**

**විසිනි**

### හැඳින්වීම :

සහල් නිෂ්පාදනයේ ප්‍රගතියත් සමගම, ශ්‍රී ලංකාව නුදුරු අනාගතයේදීම සහලින් ස්වයංපෝෂිත වන ලකුණු පෙන්වයි. යහපත් පෝෂණ තත්ත්වයක් ඇති කරලීම සඳහා ජනතාවගේ ප්‍රෝටීන අවශ්‍යතාවයද වැඩි දියුණු කරලීම ඒ සමඟම කළ යුත්තකි. අඩු ආදායම් ලබන අයට අත පෙවීමටවත් නොහැකි අන්දමින් සත්ත්ව ප්‍රෝටීන් ආහාර වල මිල දිනපතාම ඉහළ යමින් පවතී. එබැවින් වෙනත් ආදේශක ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය වේගවත් කිරීම අවශ්‍යයෙන්ම කළ යුත්තක් ව ඇත. මේ සඳහා බෙහෙවින්ම ලාභදායී ආදේශකයක් වනුයේ මාෂ බෝගයි. 1983 දී ජාතික මාෂ බෝග නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 72,000 ක් වාර්තා ය ඇති අතර ජාතික අවශ්‍යතාවයන් සම්පූර්ණ කිරීම් සඳහා 1990 වන විට මෙම නිෂ්පාදනය මෙට්‍රික් ටොන් 130,000ක් විය යුතුව තිබිණ.

දැනට ලැබෙන අස්වනු ප්‍රමාණයන් හා සසඳා බලන විට මෙම හිඟ මෙට්‍රික් ටොන් 58,000 නිපදවා ගැනීම සඳහා හෙක්ටයාර 100,000ක් වත් අතිරේක බිම් ප්‍රමාණයක් මේ සඳහා අවශ්‍ය වනු ඇත. වියළි කලාපයේ අහස් දියෙන් **පෝෂිත** ඉඩම් වලට පමණක් මෙම වගාව සීමා වී ඇති අතර, වෙනත් වාණිජ බෝග සමඟ ඉඩම් සඳහා තරඟ වැදීමටද සිදුව ඇත. බොහෝ විට මෙම වගාවන් මායිම් බිම් වලට සීමා වී ඇත. අහෝනේ ආරම්භ වන වගාවන් මෙන්ම පාංශු බාදනයෙන්, ඉඩම නිසරු වීමත් නිසා වගා කල හැකි බිම් ප්‍රමාණය තව දුරටත් සීමා වෙමින් පවතී. ලාභදායී අස්වැන්නක් ලබා ගැනීම බොහෝ විට අපහසුය. එයට හේතුව අසමාකාර වර්ෂාපතනය හේතු කොට ගෙන පසේ තෙතමනය අඩු වැඩි වීමද අසාමාන්‍ය ලෙස සිදු වීමදී. නව තාක්ෂණික දැනුම යොදා බෝග වැඩි දියුණු කොට බිම් ඒකකයකින් ලැබෙන අස්වනු ප්‍රමාණය ඉහළ නැංවීමද, විශේෂඥ දැනුම සහ යෙදවුම් සඳහා අතිරේක වියදම අධිකව, අවශ්‍ය වන කළ ගොවියාට පහසුවෙන් ලඟා විය හැකි එනම් අඩු වියදම් සහ අඩු යෙදවුම් මගින් මෙම කාර්යය ඉටු කර ගත හැකි මාර්ග සෙවීම වඩා ප්‍රයෝජනවත් වේ. ඒ අනුව මාෂ බෝග වගාව සඳහා ඉහත කී ඉඩම් වලට අතිරේකව වෙනත් ඉඩම් සම්පත් ඇත්දැයි සොයා බැලීම ප්‍රයෝජනවත් වනු ඇත.

### බලාපොරොත්තු තැබිය හැකි ප්‍රදේශ :

1982/83 වර්ෂයන්හිදී වාරි ජලයෙන් සහ අහස් දියෙන් පෝෂිතව වගා වුණු ශ්‍රී ලංකාවේ මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 557,540 වූ අතර ඉන් හෙක්ටයාර 338,554 ක්ම යල කන්නයේ වගා වූයේ නැත. යල කන්නයේ වගාවන කුඹුරු වුවද, මහ අස්වනු නෙලා ගැනීමෙන් පසු මාස 3 ක් හෝ ඊට වැඩිමනත් කාලයක් තුළම වගා නොවී පැවතුණි. දිවයිනේ වියළි සහ තෙත් කලාප දෙකේම මෙම ඉඩම් මේ අන්දමින් දිගින් දිගට පවතියි. මෙම ඉඩම් වලින් සැලකිය යුතු කොටසක්ම බැවුම් සහිත ඉඩම් පංතිවල ඉහළ තට්ටු වන පිහිටි බැවින් මනා ජල වහනයෙන් සහ හොඳ වාතයෙන් යුක්තය. එබැවින් සාර්ථක මාෂ බෝග අස්වැන්නක් ලබා ගැනීමට හිතකර සතුටුදායක අස්වැන්නක් ලබා ගැනීම සඳහා පසේ නියමාකාර තෙතමනයක් පසට අත්‍යාවශ්‍යය:

### වෙනත් රටවලින් ලැබී ඇති ප්‍රතිඵල

විදේශීය රටවල සම්ප්‍රදායික ගොවිතැන් ක්‍රම වලින් මෙන්ම, දැනට කෙරී ගෙන යන පර්යේෂණ වලින්ද පෙනී යන්නේ වී වගාවකින් පසුව පසේ, ශේෂවන තෙතමනය ප්‍රයෝජනයට ගනිමින් සාර්ථකව මාෂබෝග වගා කළ හැකි බවය.

ඉන්දියාවේ යෝග නාරාය , අය්යාර් (1962) සහ රන්ද්වාර් (1968) විසින් වී වගාවේ අස්වනු රැස් කර ගැනීමෙන් පසුව, පසේ ශේෂ වූ තෙතමනය ප්‍රයෝජනයට ගනිමින් සාර්ථක මුං වගාවක් කරන ලදී. බිම් සැකසීමට සහ වගාවට අවම වියදම් දරමින්, වී වගාවට ප්‍රථම මුං වගාවක් යෙදීම තායිලන්තයේදී කරනු ලබයි. 1978 දී ඉන්දීය කෘෂිකාර්මික පර්යේෂණ ආයතනය වාර්තාවක් නිකුත් කරමින්, ගොඩ ඉඩම් වල මාෂ බෝග වගාව වඩා සුදුසු ඉඩම් කරා ගෙන යාමේ වැදගත්කම අවධාරණය කර ඇත. වී අස්වනු නෙලාගත් පසු පසේ ශේෂ වන තෙතමනය, වෙනත් වගාවක සති 6-8 අතර වර්ධනයට සෑහේ. මුං, එලෙස වගා කළ හැකි එක් බෝගයකි. පිලිපීනයේ, ගෝමස් සහ සැන්ඩ්ස්රා පවසන පරිදි (1976) මුං භෝගය සතුව පවතින, විශේෂ ගුණාංග නිසා, එය වී වගාවකට පසු යෙදිය හැකි කදිම භෝගයකි. පෙරේරා (1977) වාර්තා කරන පරිදි, මෙම භෝගයේ ජල අවශ්‍යතාවයන් මඳ බැවින්, සති 2–3 අතර කාල සීමාවක් වුවද, තෙතමන පීඩාවක් දරා ගැනීමේ හැකියාව ඇත. තායිවානයේ ආසියාතික එළවළු පර්යේෂණ සහ සංවර්ධන ආයතනය විසින් (1975, 1976), වී වගාවකට පසු බිම් සැකසීමෙන් තොරව

මුං වගාවක් කර හෙක්ටයාරයකට ටොන් 1.6 ක අස්වැන්නක් ලබා ගන්නා ලදී. ගොසිලාන් සහ කරන්හාල්, (1983) වාර්තා කරන පරිදි තිරිඟු වෙනුවට ආදේශකයක් ලෙස, වී වගාවෙන් පසු මුං යොදා ගත හැක. ගොසිලාන් විසින් (1980) කලින් පිදෙන වර්ග 10ක් අත්හදා බලන ලදුව (වී වගාවට ප්‍රථම සූක්ෂම ගොවිතැනින්) එක් ප්‍රභේදයකින් ධාන්‍ය ටොන් 1.7 ක් ලබා ගත හැකි විය. මිලු සහ රෙකී 1983 දී පෙන්වා දී ඇති පරිදි ඔවුන් හෙක්ටයාරයකට ධාන්‍ය ටොන් 0.8ක් ලබා ගෙන ඇති අතර මෙම බෝග ශේෂ ටොන් 7.5ක් හෙක්ටයාරයක ඉඩමට එකතු කිරීමෙන් නයිට්‍රජන් කි.ග්‍රෑ. 100 ක් එම ඉඩමට ලබා දී ඇත.

යාපනය දිස්ත්‍රික්කයේ කොඩිකාමම් සහ චාවාකච්චේරි යන ප්‍රදේශවල, මුං සහ වෙනත් රණිල ධාන්‍ය බෝග (මාෂ බෝග) යෙදීම සම්බන්ධව උත්සාහයක් ද (අහස් දියෙන් පෝෂිත වී වගාවකින් පසු) ඉරණාමඩු ව්‍යාපාරයේ වාරි ජල යෙන් පෝෂිත වී වගාවකින් පසුව මේ බඳු උත්සාහයක් ද දරා ඇත. කෑගල්ල දිස්ත්‍රික්කයේ මෙදලිය ප්‍රදේශයේ, ගොවීන් පාරම්පරිකවම මහ සහ යල වී වගා අතර මැද මුං වගාවක් කරනු ලබයි. (වී–මුං–වී) කෙසේ වුවත් ශ්‍රී ලංකාවේ මේ පිළිබඳව ලැබී ඇති පර්යේෂණාත්මක දත්තයන් අල්පය.

තෙත් කෘෂි පාරිසරික කාලයන්හි හැර, බෑවුම් සහිත වී වගා කරන ඉඩම් ස්වභාවයෙන්ම සතුටුදායක ජල වහන තත්ත්වයක් පෙන්නුම් කරන අතර, වී වගාවෙන් පසු මෙම ඉඩම් මාස 2 1/2–6 අතර තුර කාලයක් පුරන්ව පවතී. නිසි කළට ගොයම් වගා කිරීමෙන්, මාෂ බෝග වගාවකට සුදුසු අතර මැද කන්නයක් හැම විටම ලබා ගත හැකි වනු ඇත. පසේ ශේෂවන තෙතමනය, විශේෂයෙන්ම තෙත් සහ අන්තර් මාධ්‍ය කලාපයන්හි දින 60–70 අතර භෝගයක් සඳහා වැඩිමනත්ව ද සෑහේ. වියලි කලාපයේදී නම් අතිරේක වාරි ජල සම්පාදනයක් මගින් අහිතකර කාලයන්, මග හරවා ගැනීමට හැකි වනු ඇත. අප්‍රියෙල් මස ලැබෙන අන්තර් මෝසම් වැසි ආධාරයෙන් දිගු කාලීන කව්පි, සෝයා බෝංචි, තෝර පරිප්පු වැනි බෝගද වගා කර හැක.

### භෝග වර්ග :

භෝග වර්ග තෝරා ගැනීමේදී පහත සඳහන් කරුණු ගැන සැලකිලිමත් විය යුතුය. එනම්, වී වගා දෙකක් අතර ඉතුරු වන කාලය, ප්‍රයෝජනයට ගත හැකි පසේ ශේෂවන තෙතමනය, හෝ භෝගය මේරෙන අවධියේ කාල ගුණ තත්වයන් සහ ප්‍රදේශයේ පවතින කෘමි හානි වලින් ප්‍රචලිතම වීම ආදියයි. වී වගා දෙකක් අතර යෙදීමට බොහෝ විට මුං සහ උඳු සුදුසු වන අතර, කුඹුරු ඉඩම් මාස කීපයක් පුරන්ව පවතින ප්‍රදේශ වලට කව්පි සහ තෝර පරිප්පු සුදුසු වේ. කෙසේ වුවත් පර්යේෂණාත්මක තොරතුරු තවදුරටත් පැහැදිලි වන තෙක්, කෙටි කාලීන භෝග වර්ගම යෙදීම වඩා සුදුසුය.

### බිම් සකස් නොකිරීමේ අවශ්‍යතාවය :

බොහෝ අවස්ථාවලදී, වී අස්වැන්න නෙලාගත් විගසම කරන කුමන බිම් හැමක් වුවද, ප්‍රායෝගික නොවේ. පසේ පවතින අධික තෙතමනයත්, මෘදු ස්වභාවයන් නිසාත්ය. බිම් සෑමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා පසේ ස්වභාවය අනුව සති 1–4 ක පමණ කාලයක් බලා සිටීමට සිදුවන්නේ එම පස ක්ෂේත්‍ර ධාරිතා මට්ටමට පැමිණෙන තෙක් වියලීම අවශ්‍ය වන බැවිනි. මේ කාලය තුළදී පසේ ශේෂව පවත්නා තෙතමනය වාෂ්පීකරණය වී ඉවත් වන අතර, බිම් සෑමෙන් මෙය වඩාත් ඉක්මන් වනු ඇත.

වී අස්වැන්න නෙලීමෙන් පසුව බිම් සැකසීමක් නොමැතිව ඊළඟ භෝගය වගා කිරීමෙන් කාලය ඉතුරු කර ගත හැකිවේ. වල් මර්ධනයක් අවශ්‍ය යයි හැඟේ නම, භෝගය වගා කිරීමට ප්‍රථම ස්පර්ශක වල් නාශකයක් යෙදීමෙන් එම කටයුත්ත කර ගත හැකි වනු ඇත.

### භෝග සංස්ථාපනය :

වී අස්වැන්න ලබාගත් විගසම, ඊළඟ භෝගය සංස්ථාපනය කළ හැක. ජලය රඳා පවතින්නේ නම්, වී අස්වැන්න නෙලීමට සතියකට හෝ දෙකකට පමණ පෙර එම ජලය ඉවත් කළ හැක. වී අස්වැන්න නෙලීමට දින කිහිපයකට පෙර මුං හෝ උඳු බීජ වැපිරීම කළ යුතුය. මෙම බීජ මඩෙහි ගිලෙන අතර, වී අස්වැන්න නෙලන අවස්ථාව එළැඹෙන විට පැල මතුවීම ආරම්භ වනු ඇත. අස්වැන්න නෙලා දින කිහිපයක් ගතවන විට මෙම පැල හොඳින් ස්ථාවර වනු ඇත. වී අස්වැන්න ලබාගත් විගසම පස මෘදුව, එහෙත් මඩව නොපවතින අවස්ථාවේදී වුවද සිටුවීම කළ හැක. වී අස්වැන්න නෙලන විට ඉපනැල්ල සෙ.මී. 10–15 පමණ උසට තැබිය යුතුයි. ඉපනැල්ල අතර සිටුවීමෙන් බෝංචි මැස්සාගේ හානිය වළක්වා ගැනීමට එය උපකාරී වනු ඇත. හෙක්ටයාරයකට පැල 250,000 කට ඉහල තැබීමෙන් මුං වල අස්වැන්න වැඩි වීමට කිසිදු රුකුලක් නොලැබෙන බව පර්යේෂණ මගින් පැහැදිලිව ඇත. කෙසේ වුවද, වර්ග අනුවත්, පසේ තෙතමනය සහ තත්නය අනුවත් පැල ගහණය වෙනස් වීමට ඉඩ ඇත.

### වසුන් යෙදීමේ අවශ්‍යතාවය :

බිම් සැකසීමකින් තොරව, වසුන් යොදා කළ මුං වගාවකින් ලැබුණු ප්‍රතිඵල විශ්මය ජනකය. ඉපනැල්ල, පොලව මට්ටමට කපා, වසුනක් ලෙස අතුරන ලදී. හෙක්ටයාරයට ටොන් 3–5 අතර වූ වසුනක් මගින් පසේ තෙතමනය ආරක්ෂා කරයි; වල් මර්ධනය කොට පස මතුපිට කබොල්ලක් ඇති වීම වලක්වාලයි; රනිල මූල ගැටිති වර්ධනය වේගවත් කොට අස්වැන්න වැඩි කරයි. කුඹුරු ඉඩම්වල ඉතුරු වන පිදුරු පසට එකතු කිරීම කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් ද නිර්දේශ කරනු ලැබේ. මෙම පිදුරු වසුනක් ලෙස යෙදීමෙන්, ඊළඟ වී වගාවට පෙර එය හොඳින් දිරාපත්වී, එහි අඩංගු මූල පදර්ථ එළැඹෙන වී වගාවටද හොඳින් ලබා ගත හැකි වන අතර එමගින් මෙම භෝග දෙවර්ගයටම වාසි සැලසේ.

කෘමි හානි මර්ධන කටයුතු වලින් හොඳ අස්වැන්නක් සහතික වනු ඇත. මල් පූදින අවස්ථාවේදී සංස්ථානික කෘමි නාශකයක් දෙවරක් ඉසීමෙන් කරල් විදින පණුවා මර්ධනය කළ හැක. විචිත්‍ර කහ වයිරසයට ඔරොත්තු දෙන භෝග වර්ග භාවිතා කළ හොත්, කෘමි නාශක ඉසීමෙන් මෙම රෝගය වාහකයන් මර්ධනය නවත්වා ගත හැකි වනු ඇත.

නොයෙක් ප්‍රදේශ වලින් ලැබුණු පර්යේෂණාත්මක දත්තයන් අනුව මුං වගාවෙන් හෙක්ටයාරයකට කි. ග්‍රෑම් 600 – 1700 අතර අස්වැන්නක් ලැබී ඇත. මෙම අස්වැන්න කෙරෙහි බලපාන තීරණාත්මක සාධකයන් නම් භෝග ප්‍රභේදය, පසේ ඇති තෙතමනය සහ කෘමි මර්ධනයේ කාර්යක්ෂම තාවයයි. සාර්ථක අස්වැන්නකින් වියළි මුං බීජ කි.ග්‍රෑ. 1000 ක් හෙක්ටයාර යකට ලබා ගත හැකි වනු ඇත. ,ටීලූ' සහ ,රෙකි' (1983) විසින් ලබා ගත් දඬු සහ පත්‍ර කොටස් (හෙක්ටයාරයට ටොන් 4 සිට 7) පසට එකතු කිරීමෙන් ජීවාන්තක කි.ග්‍රෑම් 60 – 100 අතර ප්‍රමාණයක් පසට ලබා දිය හැකි විය. එමගින් පසේ සාරවත් භාවය වැඩි, දියුණු කරන අතරම වෙනත් පෝෂ්‍ය සංඝටකද එකතු කරයි. මේ තත්ත්ව යන් යටතේ වෙනත් රණිල භෝගද මේ හා සමානවම හෝ මීට වඩා උසස් අයුරින් මාෂ බෝග වගාවන් ගොවියාට බොහෝ වාසි සැලසෙන අතර සාමාන්‍ය වගා පාලන ක්‍රම අනුගමනය කොට අවම යෙදවුම් සහිතව මෙලෙස වගා කිරීමෙන් අමතර ආදායමක් ලබා ගත හැකි වනවා මෙන්ම ඉතුරු වන භෝග ශේෂයන් සහ වසුන් මගින් පසද ස්වාභාවිකවම සරු වී නයිට්‍රජන් සහ වෙනත් යෝෂ්‍ය සංඝටකයන් පසට, එකතු වේ. වඩා හොඳ පාලනයක් යටතේ මෙ මගින් වඩා හොඳ අස්වනු ලබා ගෙන, අහේනි කාල වලදී වෙනත් ආදායම් මාර්ගයක් කෙරෙහි විශ්වාසයක් තබා ගැනීමට ද මේ නිසා හැකිවනු ඇත.

කෙසේ වුවත් පර්යේෂණාත්මක දත්තයන්ගේ මදිකම නිසා, මෙම, දූවැන්ත සම්පත කෙරෙහි තවමත් අවශ්‍ය පමණින් අත ගසා නැත. පර්යේෂණ අවශ්‍යතාවයන් සඳහා මෙම කටයුත්ත සඳහා සුදුසු ප්‍රදේශ හා ඉඩම් හඳුනා ගැනීම දූන් ඉක්මණින් කළ යුතුව ඇති කටයුත්තකි.

